# සාමාන්‍ය සමයේ දසතුන්වන සතිය
# බ්‍රහස්පතින්දා

## පළමුවන කියැවීම

උත්පත්ති පොතෙන් ගත් පාඨයෙකි.

උත්පත්ති 22: 1-19

"අප ආදිපිතුරු තුමන් වන <u>ආබ්‍රහම්ගේ</u> යාගය"

කලකට පසු දෙවියන් වහන්සේ ආබ්‍රහම් පරීක්ෂා කරමින් "ආබ්‍රහම්" කියා ඔහුට හඬගැසූ සේක. ඔහු ද "ස්වාමිනී, මම මෙහි ය" කියා උත්තර දුනි. එවිට උන් වහන්සේ "නුඹ දැන් නුඹේ පුත්‍රයා නුඹ ප්‍රේම කරන නුඹේ එකම පුත්‍රයා වන ඊසාක් ගෙන මොරියා දේශයට යන්න. එහි ගොස් මා නුඹට පෙන්වන කන්ද මත දවන යාග පූජාවක් මෙන් ඔහු මට ඔප්පු කරන්නැ"යි වදාළ සේක.

ආබ්‍රහම් උදෑසනින් නැඟිට තම කොටළුවාට සෑදලය යොදා, සේවකයන් දෙදෙනෙකු ද සිය පුත් ඊසාක් ද රැගෙන, දවන යාග පූජාව සඳහා දර ද පළාගෙන දෙවියන් වහන්සේ වදාළ ස්ථානයට පිටත්ව ගියේය. තුන්වන දින ආබ්‍රහම් හිස ඔසවා බැලූ විට, දුරින් පිහිටි එම ස්ථානය දිටීය. එවිට ඔහු සිය සේවකයන්ට කතා කොට, "කොටළුවා සමඟ මෙහි නවතින්න. දරුවා ද මම ද අතනට ගොස් වැඳ පුදා ආපසු එන්නෙමු ය"යි කීවේය.

මෙසේ කියා ආබ්‍රහම් දවන යාග පූජාවට සූදානම් කළ දර සිය පුත් ඊසාක් මත තබා, තම අතට ගින්දර ද පිහිය ද ගෙන, දෙදෙනාම එක්ව යන්න පිටත් වූහ. මෙසේ යද්දී ඊසාක් තම පිය ආබ්‍රහම්ට "තාත්තේ" කියා ඇමතූ විට, "පුතා මම මෙහිය" කියා ඔහු පිළිතුරු දුනි. එවිට ඊසාක් "තාත්තේ

මෙහි දරත් ඇත. ගින්දරත් ඇත. නමුත් පූජාවට බැටළු පැටවා කොහේදැ"යි කියා ඇසීය. එවිට ආබ්‍රහම් "පුතා, දෙවියන් වහන්සේම පූජාව සඳහා බැටළු පැටවා අපට දෙන සේකැ" යි පිළිතුරු දුනි. මෙලෙස දෙදෙනාම ගමන් කළහ.

මෙසේ ගමන් කොට දෙවියන් වහන්සේ වදාළ ස්ථානයට ඔවුන් පැමිණි විට, ආබ්‍රහම් එහි පූජාසනයක් ඉදි කර පිළිවෙළට දර කැලි තබා තම පුත් ඊසාක් බැඳ පූජාසනය පිට තැනූ දර සෑය මත තැබීය. මෙසේ තබා ඔහු අත දිගු කොට සිය පුතු මරනු පිණිස පිහිය ගත්තේය. එවිට සමිඳාණන් වහන්සේගේ දූතයා ස්වර්ගයේ සිට "ආබ්‍රහම්, ආබ්‍රහම්" කියා හඬ ගැසීය. "මම මෙහි සිටිමි" යි ඔහු කීය. එවිට දූතයා "ළමයට අත නොගසන්න. ඔහුට කිසි අනතුරක් නොකරන්න. ඔබේ පුත්‍රයා, ඔබේ එකම පුත්‍රයා පූජා කිරීමට තරම ඔබ දේව ගරු බිය ඇත්තෙකු බව මට දැන් පෙනේ ය"යි පැවසීය. එවිට ආබ්‍රහම් හිස ඔසවා බැලූ විට ඔහුට පිටුපසින් අංවලින් පඳුරක පැටලී සිටි බැටළුවෙකු දිටීය. ආබ්‍රහම් ඌ වෙත ගොස් බැටළුවා ගෙන සිය පුත්‍රයා වෙනුවට දවන යාග පූජාවක් මෙන් ඌ පූජා කළේය. තවද ආබ්‍රහම් ඒ ස්ථානයට "ජෙහොවා-ජිරේ" යන නාමය තැබීය. මීට අද දක්වා "සමිඳාණන් වහන්සේගේ කන්දේ දී සපයන ලදි" යන කීම ව්‍යවහාර වේ.

සමිඳාණන් වහන්සේගේ දූතයා දෙවන වරටත් ස්වර්ගයේ සිට ආබ්‍රහම්ට කතා කොට "සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේකැයි මම දිවුරා කියමි. ඔබේ පුත්‍රයා, ඔබේ එකම පුත්‍රයා පවා මට බිලි පූජා කිරීමට කැමති වී මෙලෙස ක්‍රියා කළ බැවින් මම බොහෝ සෙයින් ඔබට ආශිර්වාද කරමි. ඔබේ දරු පෙළපත අහසේ තාරකා මෙන් ද වෙරළේ වැලි මෙන් ද බහුල වන සේ වර්ධනය කරමි. ඔබේ පෙළපත සතුරන් පරදා රට හිමි කර ගන්නෝය. ඔබ මාගේ හඬට කීකරු වූ බැවින් මිහි පිට සියලු ජාතීහු ඔබ මගින් ආසිරි ලබන්නෝ ය"යි කීය. ආබ්‍රහම් පසුව තම සේවකයන්

වෙත ආපසු ගිය විට ඔව්හු සියල්ලෝ ම නැගිට ගොස් බෙයර්-ෂෙබාවෙහි පදිංචි වූහ.

දේව වාක්‍යය එසේය.

## පිලිතුරු ගීය

ගීතාවලිය 115: 1-6,8-9

පිලිතුර: අප ජීවතුන්ගේ දේශයෙහි සමිඳුන් අබිමුව හැසිරෙන්නෙමු.

ගීය:

සමිඳුනි, අප නිසා නොව, ඔබේ තිර පෙම නිසාත්, සත්‍යවාදිකම නිසාත්, ඔබේ නාමය නිසාත් ඔබේ මහිමාලංකාරය ප්‍රකාශ කළ මැනව.
"ඔවුන්ගේ දෙවිඳාණෝ දැන් කොතැන්හි දැ"යි ජාතීන්ට අසන්න ඉඩ දෙන්නේ කුමට ද?

අපේ දෙවි තුමාණෝ ස්වර්ගයේය. තමන් කැමති කුමන දෙයක් වුවත් එතුමාණෝ කරන සේක. ඔවුන්ගේ දේවතා රූප රිදියෙන් හා රතින් ය. මිනිසුන්ගේ දෑතේ වැඩ ය.

ඒවාට කටවල් ඇත. එහෙත් කතා නොකරයි. ඇස් ඇත. එහෙත් නොදකියි. කන් ඇත. එහෙත් නොඇසෙයි.
නාස් ඇත. එහෙත් ගඳ සුවඳ නොදැනෙයි.

ඔවුන් සාදන්නෝ ඔවුන් වාගේ ය. ඔවුන් විශ්වාස කරන සියල්ලෝත් එසේම ය. එම්බා ඉශ්රායෙල් ජනයෙනි, සමිඳුන් විශ්වාස කරන්න. ඔබේ සරණත් පළිහත් එතුමාණෝ ය.

## සාධුකාරය

ආලේලූයා! ආලේලූයා!
"ස්වර්ගයටත්, පොළොවටත් ස්වාමින් වන පියාණන් වහන්ස!
ඔබවහන්සේ මේ කරුණු පැණවතුන් හා නැණවතුන් කෙරෙන් ආවරණය කොට බාලයන්ට අනාවරණය කළ හෙයින් ඔබ වහන්සේට තුති පුදන්නෙමි"යි
ස්වාමින් වහන්සේ වදාළ සේක.
ආලේලූයා!

නොහොත්

ආලේලූයා! ආලේලූයා!
ක්‍රිස්තුස් වහන්සේ කරණකොටගෙන දෙවියන් වහන්සේ
ලෝකය තමන් වහන්සේට සමගි කර ගනිමින්
ඒ සමගි කිරීමේ සේවය අපට බාර දුන් සේක.
ආලේලූයා!

# සුවිශේෂය

සුවිශේෂක මතෙව් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

මතෙව් 9: 1-8

"එබඳු බලය මිනිසුන්ට දුන් දෙවියන් වහන්සේට ප්‍රශංසා කළහ."

ජේසුස් වහන්සේ ඔරුවට නැඟී, එගොඩ වී, සිය නුවරට පැමිණි සේක. එවිට අංශබාග රෝගියෙක් උන්වහන්සේ ළඟට යහනක තබා ගෙනෙන ලද්දේය. උන්වහන්සේ ඔවුන්ගේ ශ්‍රද්ධාව දැක, "පුත්‍රය, ධෛර්යවත් වන්න. ඔබේ පව් කමා කරන ලද්දේය"යි අංශබාග රෝගියාට වදාළ සේක. එකල විනයධරයන්ගෙන් ඇතැමෙක් "මොහු දෙවියන් වහන්සේට අපහාස කරන්නේ ය"යි තමන්ටම කියා ගත්හ. ජේසුස් වහන්සේ ඔවුන්ගේ සිතුවිලි දැන, "කුමක් නිසා නපුරු දේ සිතන්නහු ද? වඩා පහසු කුමක් ද? ඔබේ පව් කමා කරන ලදැ" යි කීම ද? නැතහොත් නැඟිට ඇවිදින්නැ"යි කීමද? එහෙත් පොළොවෙහි දී පව් කමා කිරීමේ බලය මනුෂ්‍ය පුත්‍රයාණන්ට තිබෙන බව ඔබට පෙන්වා දෙමි" යි කියමින්, "නැඟිට ඔබේ යහන රැගෙන ගෙදර යන්නැ" යි අංශබාග රෝගියාට වදාළ සේක. එවිට ඔහු නැඟිට ගෙදර ගියේය. සමූහයා ඒ දැක භය වී, එබඳු බලය මිනිසුන්ට දුන් දෙවියන් වහන්සේට ප්‍රශංසා කළහ.

සුවිශේෂ වාක්‍යය එසේය.